*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

**7 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 හා 02 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සිරිදාස <u>මොර සූරන වැස්සේම</u> නිවසින් පිටත් විය.

(i) පොද වැස්සේ ම (ii) පාන්දරින් ම
(iii) තද වැස්සේ ම (iv) මොර ගෙඩි වැටෙද්දී ම

02 අසල්වැසියන් සමග කිසිදු <u>ඇයි හොඳයියක්</u> නැතැයි ඇය කීවා ය.

(i) සුහදතාවක් (ii) තරහක් (iii) විරුද්ධත්වයක් (iv) වාසියක්

- **අංක 03 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

03 නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන,

(i) 52 කි. (ii) 54 කි. (iii) 60 කි. (iv) 62 කි.

04 මහාප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) ක, ඨ, ඵ, හ (ii) ඛ, ච, ධ, ත (iii) ග, ජ, ඩ, ද (iv) ඛ, ඣ, ඨ, ඵ

05 සඤ්ඤක අකුරක් නොයෙදුණ වචනයක් සහිත පිළිතුර තෝරන්න.

(i) පෙරමඟ (ii) අද (iii) අඬ (iv) අඹ

- **අංක 6 හා 7 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනයක් අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06 (i) සම්මිශ්‍රණ (ii) තෘශ්ණාව (iii) මිණිරන් (iv) අසාධාරන

07 (i) උපකරන (ii) ආමන්ත්‍රන (iii) දරුණු (iv) භික්ෂුනී

- **අංක 08 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

08 මම පාඩම් ........................................................... ( කරමු / කරමි )

09 නුඹලා සෙල්ලම් ........................................ ( කළෙහු / කළෙහි )

10 ගස් සුළඟින් ............................................ ( නැනෙති / වැනෙයි )

11 දී ඇති පදවල අනුක්ත රූපය ලියන්න.

(i) ළමයි ................................................ (ii) හාවෙක් ................................................

12 දී ඇති පදවල විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(i) නම්බුව ................................................ (ii) අභ්‍යන්තර ................................................

13 දී ඇති කමත් භාෂාවේ පදවලට සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පදය බැගින් ලියන්න.

(i) ගොම්පස් ................................................ (ii) ඇඹුල ................................................

14 පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) බීරි අලින්ට ........................................................ කරනවා වගෙයි.

(ii) .................................................................. දී මිරිස් ගත්තා වගෙයි.

15 පහත සඳහන් පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.

(i) මුහුණ ................................................ (ii) අහස ................................................

16 පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

(i) යාන -................................................ (ii) ................................................- පරොස්

17 දී ඇති පුරුෂවාචී පදවලට ගැළපෙන ස්ත්‍රීවාචී පද ලියන්න.

(i) සොරා ................................................ (ii) මොනරා ................................................

18 පහත සඳහන් පද සඳහා යොදන තනි පදය බැගින් ලියන්න.

(i) පරම්පරාවෙන් පැවතෙන ................................................

(ii) නැවත පණ ගැන්වීම ................................................

- **අංක 19 හා 20 ප්‍රශ්නවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.**

19 ගෙවිලියෝ කවි <u>කියමින්</u> ගොයම් කපති.

(i) අවසාන ක්‍රියා (ii) පූර්ව ක්‍රියා

(iii) මිශ්‍ර ක්‍රියා (iv) විධි ක්‍රියා

20 අක්කා පන්සලට <u>ගොස්</u> මල් පූජා කළා ය.

(i) මිශ්‍ර ක්‍රියා (ii) විධි ක්‍රියා (iii) අවසාන ක්‍රියා (iv) පූර්ව ක්‍රියා

(ලකුණු 2 x 20 = 40)

**7 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **01, 02 හා 03 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'පූජිත ජීවිත' කෘතියේ කතුවරයා කවුද?

(ii) 'මුනිගුණ අලංකාරය' කෘතියේ රචකයා කවුද?

(iii) 'ටොට්ටෝ චං' නැමැති චරිතය ඇතුළත් කෘතිය කුමක් ද?

(iv) දී ඇති පදවල අරුත් ලියන්න.

(අ) අභිනව

(ආ) අපරදිග

(v) පහත කවියේ ඉතිරි පද ලියන්න.

ගලක් පළ ගලක් දුටිමි

එගල පළා රිදී දුටිමි

.........................................................................

......................................................................... (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරාගෙන වචන **150** ට නොඅඩු රචනයක් ලියන්න.

(i) මහමග අනතුරු - වළකමු නිරතුරු

(ii) සාර්ථක ජීවිතයකට මග අධ්‍යාපනයයි.

(iii) වැඩිහිටි පරපුර රැක ගනිමු.

(iv) නිරෝගී දිවියකට ක්‍රීඩාව අවශ්‍ය වේ.

(v) ''සඳ පහන් රැයක අවදි වුනෙමි.'' (ලකුණු 20)

03 ඔබේ ගමේ ළමා සමාජය ඩෙංගු උවදුර පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සකස් කරමින් සිටී. එහිදී සාමාජිකයින් අතර ඇති වූ සංවාදය ලියා දක්වන්න. (වචන 75 - 100 පමණ තිබීම ප්‍රමාණවත් ය.)
(ලකුණු 10)

04 පහත උද්ධෘත ඇසුරින් වගුව සම්පූර්ණ කර පිළිතුරු පත්‍රයේ දක්වන්න.

(i) ''ඇයි, ඉතින් ගැළවෙන විදිහක් ඔබ ම කල්පනා නො කරන්නේ ?''

(ii) ''ස්වාමිණී, ස්වාමිණී, මේ තරම් කලබලයෙන් මේ කොහේද දුවන්නේ ?''

(iii) ''මොකට ද අයියේ කුඹුරට යතුරක්''

(iv) ''මැණිකේ ඇඹුල පේ කළා නම් හොඳයි.''

(v) ''මම ලොකු වුණා ම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා.''

| | පාඩමේ නම | කා විසින් | කා හට | කුමන අවස්ථාවක |
|---|---|---|---|---|
| (i) | | | | |
| (ii) | | | | |
| (iii) | | | | |
| (iv) | | | | |
| (v) | | | | |

(ලකුණු 2 x 5 = 10)

05 පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(i) ........................................................................................ පාසලට යමු. ( අපි / අප )

(ii) මව ............................................................................. රකියි. ( දරුවෝ / දරුවන් )

(iii) ගංගා මුහුදට ගලා ............................................................................. ( බසිති / බසියි )

(iv) .................................... ඉරිදා පොළේ බඩු විකුණති. ( වෙළෙන්දෝ / වෙළෙන්දන් )

(v) ........................................................................ පාඩම් කෙරුවෙහු. ( තෝ / තොපි )

(ලකුණු 2 x 5 = 10)

06 දී ඇති කවිය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බතට කන්න බැරි බතලේ ගල කන්ද
අලට කන්ට බැරි අලගල්ලේ කන්ද
හුනට කන්ට බැර හුන්නස්ගිරි කන්ද
මෙකඳු තුනට නායක සමනල කන්ද

(i) කවියේ සඳහන් කඳු මොනවා ද?

(ii) ඒ අතුරින් ප්‍රධාන තැනක් ගන්නා කන්ද කුමක් ද?

(iii) කවියේ ඇතුළත් සඤ්ඤක අකුරක් සහිත වචනය ලියන්න.

(iv) මේ කවිය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?

(v) ඔබ දන්නා වෙනත් ජන කවියක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) i (03) iii (04) iv (05) ii (06) i (07) iii (08) කරමි
(09) කළෙහු (10) වැනෙයි

(11) i. ළමයින් ii. භාවෙකු
(12) i. අවනම්බුව ii. බාහිර
(13) i. ගොම ii. දවල් ආහාරය
(14) i. වීණා ii. ඉඟුරු
(15) i. වත, උවන ii. ගුවන, නුබ
(16) i. වාහන ii. රොස්
(17) i. සෙර ii. සෙබඩ
(18) i. පාරම්පරික ii. පුනර්ජීවය
(19) i (20) iv

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) ගරු මර්සලීන් ජයකොඩි පියතුමා
(ii) වැලිවිට සරණංකර සංඝරාජ හිමි
(iii) හරි පුදුම ඉස්කෝලේ
(iv) (අ) නව, අලුත් (ආ) බටහිර, බස්නාහිර
(v) පැන් බොන්නට ළිඳක් දුටිමි
බැත උඩ සිට මුහුද දුටිමි (ලකුණු 2 x 5 = 10)

02 ස්වීයත්වය, නිවැරදි කරුණු ඉදිරිපත් කිරීම, මාතෘකාවට අදාළ බව හා ශිල්පීය දක්ෂතා සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 20)

03 කථන බසින් තිබුණ ද ලකුණු දෙන්න. (ලකුණු 10)

04

| | පාඩමේ නම | කා විසින් | කා හට | කුමන අවස්ථාවක |
|---|---|---|---|---|
| (i) | ගොවි බිරියගේ නුවණ | ගොවියා | බිරිඳට | ව්‍යාඝ්‍රයා හමුවූ පුවත බිරිඳට පවසන අවස්ථාව |
| (ii) | ගොවි බිරියගේ නුවණ | හිවලා | ව්‍යාඝ්‍රයාට | ව්‍යාඝ්‍රයා බයවී දුවන අවස්ථාව |
| (iii) | ඔයි රයිරේ ඔයි රාමා | අනුරාධ | සිරිමල්ට | තාත්තා යතුර ඉල්ලාගෙන එන්න කියූ අවස්ථාව |
| (iv) | ඔයි රයිරේ ඔයි රාමා | දාවිත් රාලහාමි | බණ්ඩාර මැණිකේට | කමතට ඇඹුල ගෙන ආ අවස්ථාව |
| (v) | කතා බහට සංයමයක් | ටොරිටෝ චං | මවට | දුම්රිය පොළෙන් පිටවන අවස්ථාව |

(ලකුණු 2 x 5 = 10)

05 (i) අපි (ii) දරුවන් (iii) බසියි (iv) තොපි (ලකුණු 2 x 5 = 10)

06 (i) බතලේගල කන්ද, අලගල්ලේ කන්ද, හුන්නස්ගිරි කන්ද, සමනල කන්ද
(ii) සමනල කන්ද
(iii) මෙකඳු
(iv) කරත්ත කවි
(v) ඕනෑම ජන කවියක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 2 x 5 = 10)